# 12 අර්ථාවබෝධය

භාෂාව නොනැවතී ගලන ගංගාවක් වැනි ය. හැමවිට ම නවාංග එකතු වෙමින් ඉදිරියට ගලා යයි. පැරණි බසේ වචන අලුත් වේ. එවිට ඇතැම් පද උච්චාරණ විලාසයෙන් ද අර්ථයෙන් ද වෙනස් වේ. ඇතැම් විට වෙනත් භාෂාවන් ඇසුර නිසා ද බස වෙනස් විය හැකි ය. ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණයේ දී නව පැරණි මෙන් ම සංස්කෘත, පාලි භාෂාවල වචන භාවිත කෙරේ. එම ප්‍රකාශනවල අදහස් තේරුම් ගැනීමට පදවල අර්ථ අවබෝධ කර ගත යුතු වේ. එසේ භාෂාත්මක ප්‍රකාශනවල ඇතුළත් අදහස් තේරුම් ගැනීම අර්ථාවබෝධය යි. අර්ථාවබෝධය උසස් ලෙස භාෂාව හැසිරවීමට අවශ්‍ය කුසලතාවකි.

අලුත මහණ වූ සමිත පොඩිහාමුදුරුවන්ට අවුරුදු දහය සම්පූර්ණ වුණා විතරයි. උන්වහන්සේ පැවිදි ජීවිතයේ දී මුහුණ දුන් අත්දැකීම් කිහිපයකි.

- පෙර්රුදනේ ගෙනාපු උපාසක උපාසිකාවන්ට ලොකු හාමුදුරුවෝ පින් අනුමෝදන් කළා.
  "ත්‍රෛලෝක්‍යතල තිලක සකලඥෙය සාගර පාරගතාශේෂ ගුණරත්න මන්දිරායමාන, අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ උදෙසා ශුද්ධ වූ.........."

- ගලේ පන්සලේ නායක හාමුදුරුවෝ පිරිත් අනුශාසනාවක් කරනවා.
  " ශුද්ධා බුද්ධි සම්පන්න කෘතවේදී, ගුණගරුක පින්වතුනි, ලොව්තුරා තථාගත බුදුපියාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයේ විවිධ අවස්ථාවල තමන් වහන්සේ හමුවට පැමිණියා වූ........."

- තෙපානිස් උපාසක ආතා පුන් පෝය දවසේ ධර්මශාලාවේ දී ජාතක පොත කියවනවා.
  "යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි, අප මහ බෝසතාණෝ විෂ වෛද්‍ය කුලයක ඉපිද, වෙදකමින් ජීවත් වන්නාහු ය. එකල එක් ජනපද වාසී වූ මනුෂ්‍යයකු සර්පයෙක් දෂ්ට කොටපූයේ ය....."

- පත්තිනි දේවාලයේ කපු මහතා දේවාලයේ තේවාව කරමින් කවි කියවනවා.

  ''උතුම් බුදු රුවනේ
  ලොව්තුරු දහම් සරණේ
  සමග සඟ රුවනේ
  බැතින් නමදිමු මෙතුන් සරණේ''

පොඩි හාමුදුරුවන්ට මේ එක අවස්ථාවකවත් මොනවා කියනවද කියලා හරියට තේරුණේ නෑ.

♥ මේ බව වටහා ගත්තු ලොකු හාමුදුරුවෝ පොඩි හාමුදුරුවන්ට අවවාද කළා. " පොඩිනම හාමුදුරු කෙනෙක් වුණහම හොඳට පාලි, සංස්කෘත භාෂා ඉගෙන ගන්ඩ ඕනෑ. එතකොට තමයි සිංහල භාෂාව වුණත් හොඳට තේරුම් ගන්ඩ පුළුවන් වෙන්නේ. පැරණි බණ කථා පොත්, කවිපොත් තේරුම් ගන්න එතකොට හොඳට පුළුවන් වෙනවා........."

**අර්ථාවබෝධයට උපදෙස්;**

- පෙළ හොඳින් කියවන්න.
- දුෂ්කර වචන ලකුණු කර ගන්න.
- ඒවායෙහි අර්ථ දැන ගන්න.
- එම අර්ථ යොදා පෙළ නැවත කියවන්න.
- එය ඔබේ බසින් ලියන්න.
- එය අර්ථවත් ව ගැළපේදැයි සංසන්දනය කර බලන්න.
- ගුරුවරයාගේ උපදෙස් අනුව ශබ්දකෝෂය භාවිතයට හුරුවන්න.

## - තාරකා -

දිලිහි දිලිහි
ආකාසේ
බබලන මල් -
තාරකා

බැබලි බැබලි
ආකාසේ
දිලිහෙන මල් -
තාරකා

කළුවර රෑ
ආකාසේ
සිනහ වෙවී -
තාරකා

ගන්ටත් බෑ
දෙන්ටත් බෑ
පුංචි රුවන් -
තාරකා



- ආනන්ද රාජකරුණා -

ක්‍රියාකාරකම 12.1

i. මෙම පැදිපෙළ, පන්තියේ සියලු දෙනා එක් ව ශබ්ද නගා කියවන්න.
ii. මෙහි කවියා තරු ගැන විශේෂිත ලෙස දක්වා ඇති අයුරු උපුටා ලියන්න.
iii. පැදි පෙළෙහි අර්ථය ඔබේ බසින් ලියන්න.

පහත සඳහන් ඡේදය කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

## මණි ප්‍රශ්නය

ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් කුස රජ්ජුරුවන්ට දුන් මැණික තෙමේ අට තැනෙකින් වක් වූයේ ය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවුණූ පුරාතන හුය දිරා ගොස් කැඩී ගියේ ය. පරණ හුය හැරපියා අලුත් හුයක් අවුණා ලන්නට කිසි කෙනෙක් නොපොහොසත් ය. එක් දවසක් මේ මැණිකෙහි "පරණ දිරා ගිය හුය හැරපියා අලුත් ලණුවක් ලව" යි කියා යවමැදුම්ගමැ ඇත්තනට වේදේහ රජ්ජුරුවෝ යැවූහ.

ගම් වැස්සෝ පරණ හුය අරින්නටත් අලුත් හුය ලන්නටත් නො පිළිවන් වූවා හු මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට කීවාහු ය. පණ්ඩිතයන් වහන්සේ " තෙපි නොසිතව, මී ටිකක් ගෙන්වා ගනුව" යි කියා ගෙන්වාගෙන මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බිඳු ගල්වා, පලස් හුයින් ලණුවක් අඹරා අග මීයෙහි ගලා මඳක් මැණිකේ සිදුරට වද්දලා, කුහුඹුවන් නික්මෙන කුහුඹු බිලයෙක තබා ලූ සේක.

කුහුඹුවෝ මීයෙහි ගඳින් බිලයෙන් නික්ම මැණිකෙහි දිරා ගිය පරණ හුය කාගෙන පලස් හූ අග ඩැහැගෙන යටින් අදනාහු අනෙක් ඇලයෙන් පිටත් කොට පීහ. පණ්ඩිතයන් වහන්සේ මැණිකෙහි ලණුව ඇවිණී ගිය බව දැන ගෙන "රජ්ජුරුවන්ට දෙව" යි කියා ගම්වැස්සන්ට මැණික දුන් සේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට යැවූහ. රජ්ජුරුවෝ ලණුව ඇවුණූ උපාය අසා සතුටු වූහ.

(උම්මග්ග ජාතකය)

**අර්ථ පුහුණුවට**

| | |
|---|---|
| හූ ලණුවකින් | = නූලකින්. |
| පලස් හුයින් | = පලස් විවීමට ගන්නා නූලෙන්. |
| බිලයෙක | = සිදුරක. |
| ගඳින් | = සුවඳින්. |
| ඇලයෙන් | = පැත්තෙන්. |

**ක්‍රියාකාරකම 12.2**

i. ඉහත සඳහන් කථා පුවත ඔබේ බසින් ලියන්න.
ii. මෙහි එන දුෂ්කර වචන සොයා ඒවායෙහි අදහස් ලියන්න.
iii. පහත දක්වන යෙදුම්වල අර්ථ ලියන්න.
   (අ). පරණ හුය හැරපියා අලුත් හුයක් අවුණා ලන්නට කිසි කෙනෙක් නොපොහොසත් ය.
   (ආ) මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බිඳු ගල්වා .